


ප්‍රමිලා දේවිය විසින් සිය පෙම්වතා වන දස්කොන් අදිකාරම වෙත ගයන ලදැයි සැලකෙන පෙම් කවි අමරණීය ඓතිහාසික ප්‍රේම අන්දරයක නොමැකෙන සටහන්.

දස්කොන් නාට්‍යය පිළිබඳ පිළිසඳරක යෙදෙන්නට මා එහි අධ්‍යක්ෂක චම්පා බුද්ධිපාල හමුවුණා. චම්පා බුද්ධිපාල කවුද කියා අපේ පාඨකයින්ට අමුතුවෙන් හඳුන්වා දිය යුතු නැහැ. චම්පා බුද්ධිපාල ජෝන් ද සිල්වා, චාර්ල්ස් ඩයස්, ඩග්ලස් සිරිවර්ධන වැනි නාට්‍යකරුවන් සේම නීති වෘත්තිකයෙක්. ඔහු නාට්‍යවලට මුලින්ම සම්බන්ධ වුනේ 1975 දී ලයනල් වෙන්ඩ්ට් හි මහාචාර්ය සරච්චන්ද්‍රයන් සහ ධම්ම ජාගොඩයන් ගේ අධ්‍යක්ෂණයෙන් පැවැත්වුනු රංග ශිල්ප ශාලිකා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමෙනුයි. ඔහු 1976-1980 කාලයේ. මනමේ නාටකයේ රාජගුරු ලෙසත් '. ඉන් පසුව 1986 දී මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ඇරයුම මත මනමේ නාටකයේ වැදිරජු ලෙස රඟපෑමටත් ඔහුට අමතක නොවන වරමක් ලැබුනා.

මා මුලින්ම චම්පා ගෙන් ඇසුවේ දස්කොන් ගැන මේ ලෙස නාට්‍යයක් නිර්මාණය කරන්න අදහස ඇතිවුනේ කොහොමද කියායි. "ඔබ අප හුග දෙනෙක් වගේ මමත් කරුණ කාලෙ ඉඳලාම මේ කතාව අසා තිබුනා. මගේ ක්‍රිෂ්ණා නාට්‍යය අවසන් වුනු පසුව මාත් චන්න විජේවර්ධනත් සාකච්ඡා කලා මීලඟට කුමන නිර්මාන කාර්යයක යෙදෙමුද කියල. මෙතනදි චන්න තමයි දස්කොන් ගැන අදහස මුලින්ම ගෙනාවෙ. එය මගෙත් සිත ගත්ත. පසුව මම දස්කොන් පුවත ගැන ඉතා හොඳින් ඉතිහාසය ගවේශණය කරල මේ කතා පුවත ලිව්වා."

සාමාන්‍ය දස්කොන් - ප්‍රමිලා පෙම් පුවත අප හැම හොඳින් දන්න නිසා අප නොදන්නා කරුණු ගැන අවධානය යොමු කරමු යයි මා චම්පා ගෙන් ඉල්ලා හිටියා.

"දස්කොන් ගෙ මුළු නම පේඩ්රෝ ඩි. ගස්කොඤ්ඤ. ඔහු ප්‍රංශ පියෙකුට දාව පෘතුග්‍රීසි මවකගෙන් උපන් දරුවෙක්. මේ පුවත සිදුවන්නේ 1707 සිට 1739 කාලයේ ලංකාවේ උඩරට පාලනය කළ නරේන්ද්‍රසිංහ රජුගේ සමයේදීයි. මේ කාලයේ ලන්දේසීන් මුහුදු බඩ පාලනය කළා. දස්කොන් පිළිබඳ කවුරුත් වැඩිය නොදන්නා කරුණක් තමයි ඔහුලංකාවේ ප්‍රථම විජාතික අගමැති බව. ඔහු වැලිවිට ශ්‍රී සරණංකර හිමියන්ගෙන් සිංහල හොඳින් ඉගෙන ගත්තා. දස්කොන් හොඳ කවියෙක්."

මේ දිනවල ලන්දේසීන් හා වරින් වර යුද වදිමින් කෲර ලෙස රාජ්‍ය පාලනය කල ලංකාවේ අවසාන සිංහල රජු වූ නරේන්ද්‍රසිංහ රජතුමා සහ උඩරට රදල අදිකාරම් පැලැන්තිය අතර තිබූ බල අරගලය සමතුලිත කරන්නට තමයි රජතුමා දස්කොන්ව සිය අගමැතිවරයා ලෙස පත් කරන්න ඇත්තේ. මෙය අනෙක් ප්‍රභූන් ගේ නොසතුටට හේතු වුනා. මේ වෙන කොට රජතුමා තම රාජ්‍යයේ ස්ථාවරය පතා ඉන්දියාවෙන් උභය කුල පාරිශුද්ධ වඩුග කුමරියක් වූ ප්‍රමිලා ව සරණ පාවාගෙනයි හිටියේ. රජුගේ පාලන කාලය තුල සිදුවූ ලේ වැගිරුන කුමන්ත්‍රණ දෙකක් ගැන ඉතිහාසයේ සඳහන් වෙනවා. "

"මෙතනදී තවත් කරුණක් කියන්න ඕනැ. මහාවංශයේ සඳහන්වෙන්නේ දස්කොන් ප්‍රමිලා පෙම් පුවත සිදුවුනේ දෙවන රාජසිංහ (නරේන්ද්‍රසිංහ රජුගේ සීයා) සමයේ කියායි. මෙය වැරදි බව ලෝනා දේවරාජා ඉතිහාසඥවරිය මූලාශ්‍ර ඇසුරෙන් පෙන්වා දී තියෙනවා."

"ජෝන් ද සිල්වා දස්කොන් පුවත අනුසාරයෙන් නිපදවූ නාට්‍යයටත් පසුබිම වුනේ දෙවන රාජසිංහ යුගය. ඔහු ගේ නාට්‍යයේ මා දකින තවත් ප්‍රශ්ණයක් නම් එය අනාචාරයේ දුර්විපාක පෙන්වීමට කළ නාට්‍යයක් වීමයි. නමුත් මේ පෙම් පුවතේ ඊට වඩා සුන්දර එමෙන්ම ගැඹුරු කතාවක් සඳහන් වෙනවා."

"මගේ දස්කොන් නාට්‍යයේ මේ පෙම් පුවතට පසුබිම් වෙනවා එවකට රටේ පැවති දේශපාලන වාතාවරණය. මේ වනවිට කතෝලික මිෂනාරින් කතෝලික ආගම ප්‍රචාරය කරමින් හිටියා. පූජ්‍ය වැලිවිට සරණංකර වැනි අති ප්‍රබල බෞද්ධ නායක හිමිවරුන් හිටියා. මීට අමතරව ප්‍රමිලා දේවියගේ සම්බන්ධතාවය උඩ ඉන්දියාවේ වඩුග බලපෑමත් උඩරට රාජ්‍යයට කෙලින්ම අදාලව තිබුනා. බෞද්ධ රදල අදිකාරම්වරු සිතුවා අගමැති දස්කොන් කතෝලික මිෂනාරින්ට වැඩි වාසි ලබා දෙනවා කියා. ඔවුන් සැලසුම් කලා දස්කොන් ඉවත් කරන්න. මේ කතා වස්තුව හොඳින් අධ්‍යයනය කරගෙන යනවිට පෙනී යනවා රජුට කෙලින්ම දස්කොන් මරන්නට අවශ්‍ය නොවූ බව."

"දස්කොන් හිරබත් කමින් සිටි කාලයේ නෝක්කාඩුමාලය නමින් කවි පොතක් ලියා තමන්ගේ නිර්දෝෂී භාවය රජුට ඔප්පු කරන්නට තැත් කර තියෙනවා. නමුත් කුමන්ත්‍රණයක් මගින් මේ පොත රජුට නොලැබෙන්නට කටයුතු යෙදිල තියෙනවා. මෙම කුමන්ත්‍රණයේ ප්‍රධානියා තමයි ලෙව්කේ දිසාවේ. ඔහු දස්කොන් නාට්‍යයේ ප්‍රධාන චරිතයක්."

දස්කොන් නිෂ්පාදනය ගැන කතා කරමින් චම්පා මෙලෙස ප්‍රකාශ කලා.

"මේ නාට්‍යයේ ප්‍රධාන දස්කොන් චරිතය සඳහා මා තෝරාගත්තා අපේ දිනේෂ් පෙරේරා නර්තන ශිල්පියාව. ඔහුගේ නැටුම් පිළිබඳ හසල දස්කම් සහ නාට්‍ය රංගනය පිළිබඳ පරිචය මගේ නාට්‍යමය අවශ්‍යතා සමග ඉතා හොඳින් ගැලපෙනවා. කුමරී, සෙනේ පිදේනම් 'පෙම්වත් ඔබගේ' 'අපේ ජන රජිඳානෝ' යන සිඩ්නිහි ජනප්‍රිය වූ ගී සඳහා මුලු නාට්‍යයේ දී නැටුම් අධ්‍යක්ෂණය කළේ දිනේෂ් පෙරේරා.

රජු ගේ චරිතය නිරූපනය කරන්නේ ප්‍රවීන රංග ශිල්පී ශ්‍රියන්ත මෙන්ඩිස්. ප්‍රමිලා දේවිය ලෙස රඟන්නේ දක්ෂ රංගන ශිල්පිණියක වන හිමාලි සයුරංගි. ලෙව්කේ දිසාව ලෙස ප්‍රවීණ රංග ශිල්පි ශ්‍රීනාත් මද්දුමගේ රඟපාන අතර කුමන්ත්‍රණකාර රම්මාලෝක දිසාව ලෙස රඟපාන්නේ ජනප්‍රිය රංග ශිල්පියකු වන කුමාර තිරිමාදුර. වැලිවිට සරණංකර හිමි ලෙස වසන්ත විට්ටච්චි ප්‍රවීණ රංග ශිල්පියා රඟපානවා. මේ සියලුම රංගන ශිල්පින් හා ශිල්පිණියන් ශ්‍රී ලංකාවේ සම්මානනීය අති දක්ෂ හා ජනප්‍රිය ශිල්පින් බව අමුතුවෙන් කියන්න ඕනෙ නැහැ.

දස්කොන් නිෂ්පාදනයට එකතුවෙන ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර අපේ කට්ටිය තමා දිනේෂ් පෙරේරා ට අමතරව නැටුම් කණ්ඩායම් ඇතුළුව විසි දෙනෙක් පමණ පිරිසක් සහභාගිවෙනවා. මෙම නලු නිළියන් අතරට අයෝමි බොස්කෝ. තාරා බුද්ධිපාල. පාලිත ගුණසේකර. චාලක ජයසිංහ. සම්පත් ජයවීර. නිමල් වනිගසිංහ. සමන් නානායක්කාර. තිලක් රණසිංහ. පාලිත ගුණසේකර. සුදු රත්නප්පුලි. ජයන්ත රත්නායක යනාදී නලු නිළියන් ඇතුළත් වෙනවා. නර්තනයෙන් මිහිරි අමරසේකර. නදීෂා ඒකනායක. වරුනි ප්‍රනාන්දු. තිලිණි ගොඩමාන්න. ශ්‍යාමා ජයවීර. ඉසුරු රත්නායක. තිළිණි වනිගතුංග. ශෙහාරා විජයපාල දායකවෙනවා.

දස්කොන් නාට්‍යය ගීත 10 කින් සමන්විත සංගීතය ඉතාමත් ඉහලින් උපයෝගී කරගන්නා නාට්‍යයක්. මින් ගීත 8 ක සංගීතය නිර්මාණය කළේ රෝහණ වීරසිංහ. මීට අමතරව පණ්ඩිත් අමරදේවයනුත් ගීත දෙකකට සංගීත නිර්මාණය කළා. මින් එක ගීතයක් දස්කොන් මියගිය පසුව ගැයෙන ඉතාමත් උද්වේග කර එකක්. අනෙක දස්කොන් සහ ප්‍රමිලා ගේ ප්‍රේම ජවනිකාවක් නිරූපනය කරන්නක්. පසුබිම් සංගීතය නිර්මාණය කරන්නේ තරුපති මුණසිංහ.

පසුබිම් ගායනාවෙන් සහභාගී වෙනවා පණ්ඩිත් අමරදේව, විශාරද නන්දාමාලිනී, උරේෂා රවිහාරි,


චම්පා බුද්ධිපාල

කෝලිත භානු සහ චන්ද්‍රානි බුද්ධිපාල. ගී පදමාලා වැඩිහරියක් සුනිල් ආරියරත්නයන් ගේ. ඒ අතර කුමරී, සෙනේ පිදී නම්. පෙම්වත ඔබගේ. අපේ ජන රජිඳානෝ. ගී රචනා කළේ චම්පා බුද්ධිපාල. ඇඳුම් නිර්මාණය චන්දන වික්‍රමසිංහ. බනුර මලිත හෙට්ටිආරච්චි සහ සුජීව චන්දන 1707 පැවති රංග වස්ත්‍ර ගවේෂණය කර තිබෙනවා. මෙහි වෙස් ගැන්වීම වසන්ත විට්ටච්චි ගේ. දස්කොන්හි ඓතිහාසික ගවේෂණය නව අර්ථ නිරූපණය කතා පුවත සහ අධ්‍යක්ෂණය චම්පා බුද්ධිපාල. ශ්‍රී රංග සභාව වෙනුවෙන් ඉදිරිපත් කරන මේ නාට්‍යයේ සහය නිෂ්පාදනය සහ සංවිධානය චන්ද්‍රානි බුද්ධිපාල කරන අතර වේදිකා පරිපාලනය නිහාල් ප්‍රනාන්දු සහ කණ්ඩායම විසින් කරනු ලබනවා.

තම නාට්‍යය පිලිබඳ අදහස් දක්වන චම්පා බුද්ධිපාල මෙසේ කියනවා. ''ක්‍රිෂ්ණා නාට්‍යය ශ්‍රී ලංකාවෙන් පිටත නිර්මාණය ලද ප්‍රථම පුරාවෘත ස්වතන්ත්‍ර නාට්‍යය බවට පත්වී නාට්‍ය වංශ කතාවේ මං සළකුණු තිබ්බා. ඒ විතරක් නෙවෙයි එය ඔස්ට්‍රේලියානු මාධ්‍ය අවධානය දිනා ගනිමින් ABC TV නාලිකාවේ ෆෝකස් හි විශේෂ ප්‍රචාරයකට ලක්වුණා. ක්‍රිෂ්ණාට වඩා දැවැන්ත නිර්මාණයක් වන දස්කොන් ඔස්ට්‍රේලියාවේ සිංහල නාට්‍ය ක්ෂේත්‍රයේ තවත් මං සළකුණක් තියෙන බව මට විශ්වාසයි''

දස්කොන් නාට්‍යය 2008 අගෝස්තු 24 වන ඉරිදා රාත්‍රී 7 ට පැරමටා චර්ච් ස්ට්‍රීට් හි පැරමටා රිවර්සයිඩ් තියටර් හිදීත්, අගෝස්තු 16 වන **senasurada Canberra hi Hawker college** රඟහලේදී ත්, අගෝස්තු 30 වන **senasurada Melbourne hi Ringwood East hi, Mines Road hi Karralyka Centre** රඟහලේදී ත් **wedika gatha wenawa.**

*පිළිසඳර*

රසික සූරියආරච්චි